**ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව - 2024**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 208 - ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 19 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකිම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරිම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

**(අ) දේපල පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | හෙක්ටයාර 4.6317 ක ජාතික කෞතුකාගාර ඉඩම හා ගොඩනැගිල්ල 2013 වර්ෂය පදනම් කරගෙන රු.10,800,000,000 ක තක්සේරු වටිනාකමකට මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණ ද මෙම දේපළ තක්සේරු කර 2024 වර්ෂය වන විට වසර 11 ක කාලයක් ගතවී ඇතත් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයෙන් 2018 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශයේ (2) ඡේදයේ සඳහන් පරිදි ඉඩම් හා ගොඩනැගිලි නැවත තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි සහ භූමිය තක්සේරු කිරීම සඳහා කිහිපවරක්ම තක්සේරු දෙපාර්තමේන්තුවට දැනුම් දුන් අතර, මේ වන විට එහි තක්සේරු කටයුතු සිදු වෙමින් පවතී. තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් දින තුනක් පැමිණ එහි සියළු මැනුම් කටයුතු සිදු කළ අතර, තක්සේරු වාර්තාව ඉදිරි දිනෙක ලබා දෙන බව තහවුරු කර ඇති බව දන්වා තිබුණි. | ගිණුම් පිළියෙල කිරීමේදී චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතු වන බව. |
| (ii) | දෙපාර්තමේන්තුවට අයත් අනෙකුත් ප්‍රාදේශීය කෞතුකාගාර වන නිදහස් අනුස්මරණ කෞතුකාගාරය, මහනුවර ජාතික කෞතුකාගාරය, අනුරාධපුර ජන කෞතුකාගාරය සහ ගාල්ල ජාතික කෞතුකාගාරය සම්බන්ධයෙන් වූ ඉඩම් හා ගොඩනැගිලි වල අයිතිය පවරාගෙන වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | නිදහස් අනුස්මරණ කෞතුකාගාරය ස්වදේශ කටයුතු අමාත්‍යාංශය සතු බවත්, මහනුවර ජාතික කෞතුකාගාරයේ ඉඩම් පරිහරණ අයිතිය පමණක් දෙපාර්තමේන්තුව සතු නිසා, අනුරාධපුර ජන කෞතුකාගාරය දෙපාර්තමේන්තුවට පවරාදී නොමැති බවත්, ගාල්ල ජාතික කෞතුකාගාරය පවරා දීම සඳහා අදාළ ආයතන වලින් නැවත එකඟතාවය ඉල්ලා යවා ඇති බවත්, පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරය පවරා ගැනීමේ | දෙපාර්තමේන්තුවට අයත් සියලුම ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් විය යුතු වන බව. |

| | | | |
|---|---|---|---|
| | | කටයුතු සිදුකරමින් පවතින බවත් දන්වා තිබුණි. | |
| **(iii)** | මූල්‍ය ප්‍රකාශන වල ACA 02 ආකෘතිය තුළ මෘදුකාංග සංවර්ධනය සඳහා විගණිත වර්ෂය තුළ වැය කරන ලද වටිනාකම රු.3,778,343 ක් වුවද, පරිගණක මුද්‍රිත SA 82 ආකෘතිය අනුව මෘදුකාංග සංවර්ධනය සඳහා මිලදී ගැනීම් ලෙස රු.3,870,023 දක්වා තිබුණු අතර, එහි වෙනස රු.91,680 ක් විය. | 2024 අප්‍රේල් මස වියදම් ගිණුම්ගත කිරීමේදී රු. 91,680 ක වටිනාකම වැරදීමකින් 208-02-02-2106 වැය විෂයයට හර වීම නිසා 2024 මැයි මස එය නිවැරදි කිරීමට 208-02-03-011-2106-0-13 යන නිවැරදි වැය විෂයයට ජ'නල් වවුචරයක් CIGAS පරිගණක මෘදුකාංගයට ඇතුළත් කරන ලදී. ඒ හේතුවෙන් එම වටිනාකම දෙවරක් වත්කම් ලෙස ගිණුම්ගත වීමේ වරද නිවැරදි කිරීමට CIGAS පද්ධතියෙන් ඉවත් කිරීමට කටයුතු කළ ද, ඒ මඟින් ලෙජර් ශේෂය පමණක් අඩුවෙන් පෙන් වූ අතර, BOS Report හි එම වටිනාකම ඉවත් වී නොතිබුණි. එය 2025 වර්ෂයේදී නිවැරදි කිරීමට අදාළ ගැළපුම් සිදු කරන බව දන්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතු වන බව. |
| **iv** | මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය අනුව මූලධන වත්කම් අත්පත් කර ගැනීම් සහ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි (ACA 6) වත්කම් මිලදී ගැනීම් අතර රු. 4,564,665 ක වෙනසක් නිරීක්ෂණය විය. | මානව විද්‍යා අංශය වෙත අල්මාරි මිලදී ගැනීම සඳහා කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව වෙත මෙම ප්‍රතිපාදන පැවරීම සිදු කර තිබුණු බවත්, ගිණුම් පිළියෙල කරන අවස්ථාව වන විටත් අදාල අල්මාරි දෙපාර්තමේන්තුව වෙත ලැබී නොතිබුණු බවත් දන්වා තිබුණි. | වර්ෂය තුල මිලදී ගැනීම් සඳහා ප්‍රතිපාදන පැවරීම් සිදු කලේ නම් අදාල වර්ෂය තුල වත්කම් ලබා ගැනීමට ද, ගිණුම්ගත කිරීමට ද කටයුතු කල යුතුය. |

(ආ) අග්‍රිම ශේෂය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2024 වර්ෂය සඳහා අග්‍රිම ගිණුම පිළිබඳ ප්‍රකාශනය (ACA 03) තුළ 2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂය රු.3,562,756 ක් ලෙස පෙන්නුම් කළද, වසර අවසන් අග්‍රිම ශේෂය භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කළ පසු නිවැරදි ශේෂය රු.687,338ක් වූයෙන් වෙනස රු.2,875,418 ක් විය. | ACA – 03 තුළ මුදල් මගින් අග්‍රිම පියවීම ලෙස වසර අවසාන ශේෂය වන රු. 2,875,418 ඇතුළත් කළහොත් 2024.12.31 දිනට ආයතන පොත් අනුව ශේෂය රු. 687,338 ක් වේ. එවිට 2024.12.31 දිනට භාණ්ඩාගාර පොත් අනුව ශේෂය (SA – 70) ආකෘතිය වන රු.3,562,756 හා තුලනය නොවේ. තවද, 2022, 2023 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී ද, වසර අවසාන මුදල් මගින් අග්‍රිම පියවීම ලෙස දක්වා නොමැති අතර, ඉදිරි මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මෙමගින් දක්වා ඇති පරිදි කටයුතු කිරීමට අපේක්ෂා කරන බව දන්වා තිබුණි. | අග්‍රිම ගිණුම පිළිබඳ ප්‍රකාශනයෙහි වර්ථමාන අග්‍රිම ශේෂය නිවැරදිව දැක්විය යුතුය. |
| (ii) | 2024 දෙසැම්බර් 16 දිනැති අංක 6/2024 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 7.4 ඡේදය ප්‍රකාරව වසර අවසානයේ භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කරන ලද රු.2,875,418 ක් භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ) ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අන්තර්ගත කර නොතිබුණු අතර, එම ශේෂය 2024 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂයක් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ ඇතුළත් කර තිබුණි. මේ අනුව ඉදිරිපත් කළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ මුදල් පොත පියවා මුදල් ශේෂය ප්‍රේෂණය කිරීම නිවැරදි ලෙසින් ගිණුම මගින් පෙන්වා නොතිබුණි. | ඉදිරියේදී මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී වසර අවසාන අග්‍රිම ශේෂය 7.4 ඡේදයේ උපදෙස් පරිදි අන්තර්ගත කරන බව දන්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වන බව. |

## 2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයන් 13 ක මුළු ශුද්ධ ප්‍රතිපාදන එකතුව රු.17,800,000 ක් වූ අතර, වියදම රු.8,923,753 ක් හා ප්‍රතිපාදන ඉතිරිය රු.8,876,247 ක් විය. එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට සියයට 31 සිට 88 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි. | 2024.01.10 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ ප්‍රකාරව වියදම් පාලනය කිරීම, අපේක්ෂිත පරිදි ඉන්ධන වියදම් දැරීමට සිදු නොවීම, පවිත්‍රතා සේවා වැය විෂයේ අපේක්ෂිත පරිදි වියදම් සිදු නොවීම, අපේක්ෂිත පරිදි ජංගම ප්‍රදර්ශන නොපැවැත්වීම, අපේක්ෂිත පරිදි නිලධාරීන්ගෙන් ඉල්ලීම් ඉදිරිපත් නොවීම, ස්ථාන මාරු ලබාගැනීම හා විශ්‍රාම යාම සහ බහුකාර්ය සහයකයින් සේවයෙන් ඉවත් වී යාම නිසා ඔවුනට වැටුප් ගෙවීමට සිදු නොවීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දන්වා තිබුණි. | නිසි අධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වන බව. |
| (ආ) | මූලධන වැය විෂයයන් 05 ක මුළු ශුද්ධ ප්‍රතිපාදන එකතුව රු.185,475,886 ක් වූ අතර, වියදම රු.121,965,905 ක් හා ප්‍රතිපාදන ඉතිරිය රු.63,509,981 ක් විය. එම ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයට සියයට 30 සිට සියයට 59 දක්වා පරාසයක් ගෙන තිබුණි. | අදාළ කාර්යය නිම නොකිරීම නිසා වියදම් සිදු නොවීම, විදේශ ප්‍රදාන මත සිදු කරන ලබන ව්‍යාපෘතිය 2025 අප්‍රේල් මස දක්වා ක්‍රියාත්මක වීම සහ අපේක්ෂිත ඇස්තමේන්තුවලට වඩා අඩු පිරිවැයකින් අදාළ කාර්යය අවසන් කර ගත හැකි වීම වැනි හේතු නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව දන්වා තිබුණි. | නිසි අධ්‍යයනයකින් යුතුව ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වන බව. |

## 3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 208-2-2-0-2103 වැය විෂයය යටතේ ගිනි ආරක්ෂණ පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.180,000,000 ක් වූ අතර, වර්ෂයේ වියදම රු.180,000,000 ක් විය.එසේ වුවද, වර්ෂ අවසානයේදී ප්‍රතිපාදන ඉක්මවා රු.21,884,027 ක බැරකම් හා බැදීම් වලට එළඹ තිබුණි. | 2024 වර්ෂයට ඉල්ලුම් කර තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීමත්, ඒ සඳහා අවශ්‍ය අමතර ප්‍රතිපාදන ඉල්ලා 2024 වර්ෂය තුළ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අත්සනින් යුක්ත ලිපියක් අයවැය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ ද, අදාළ ප්‍රතිපාදන නොලැබීමෙන්, මෙම වියදමෙහි කොටසක් ලෙස රු.21,884,027ක් 2025 වර්ෂයේ වෙන් කළ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනවලින් බැරකම්වලට එළඹීමට සිදුවූ බව දන්වා තිබුණි. | වර්ෂයේ ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට නොඑළඹිය යුතු වන බව. |
| (ආ) | 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ ඡේද අංක 03 හා 04 අනුව බැදීම්, බැරකම් හා බැරකම් පියවීමේ ක්‍රියාවලිය ආවරණය වන පරිදි දෙපාර්තමේන්තුව විසින් CIGAS ගිණුම්කරණ පද්ධතිය දෛනිකව යාවත්කාලීන කර නොතිබුණි. | වසර තුළ ගෙවීම් කටයුතු සිදු කිරීමේදී බැදීම්, බැරකම් හා බැරකම් පියවීමේ ක්‍රියාවලිය නිවැරදිව සිදු කරන අතර, වර්ෂය අවසානයේදී ගිනි ආරක්ෂණ පද්ධතියට අදාළ අවසාන බිල්පත දෙසැම්බර් මස අවසානයේදී ලද බැවින්ද, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා, උපයෝගී බිල්පත් සඳහා ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හා පසුව ලද වවුචර් පැවතීමත් නිසා මෙම වැඩසටහන්වලට අදාළව පමණක් බැදීම් හා බැරකම් ලෙස CIGAS පද්ධතිය තුළ ගිණුම්ගත කිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතු වන බව. |

## 3.3. නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| (i) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ අංක 3.1 මගින් ප්‍රකාශිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 113 (6) හා මාර්ගෝපදේශ අංක 01 හි (ඉ) හා (ඊ) | 1,111,512 | 2024 දෙසැම්බර් 31 දිනට සේවය හැර ගිය සේවකයින්ගෙන් අයවිය යුතු රු.1,111,512 ක් වූ ණය ශේෂය චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියා කර නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024.12.31 දිනට සේවය හැර ගිය සේවකයන්ගෙන් අය විය යුතු රු. 1, 152,445.00 ක මුළු ණය මුදල නිරවුල් කිරීම සඳහා බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මගින් අදාළ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉල්ලීම් ලිපියක් 2024 වර්ෂයේදී එම අමාත්‍යාංශය වෙත යොමු කළ නමුත් ඊට අදාළ අනුමැතිය ලැබී තිබුණේ 2025 වර්ෂයේ පෙබරවාරි මාසයේදීය. ඒ හේතුවෙන් එම ණය මුදල් අය කර ගැනීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ක්‍රියා කළ යුතු වන බව. |
| **(ii)** | 2024 ජූලි 02 දිනැති අංක අමප/24/1125/620/020 දරන අමාත්‍ය මණ්ඩල තීරණ අංක 31 (I) හා (II) | - | 2024 වර්ෂයේදී රත්නපුර ජාතික කෞතුකාගාර ගොඩනැගිල්ලේ සංරක්ෂණමය අළුත්වැඩියා කටයුතු වහාම ආරම්භ කරන ලෙස දන්වා තිබුණද, වාර්තාවේ දින දක්වාත් ආරම්භ කර නොතිබුණි. | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් පූර්ව ලංසු කැඳවීමේ සාකච්ඡාවක් 2024.10.02 දින රත්නපුර ජාතික කෞතුකාගාර පරිශ්‍රයේදී පවත්වා තිබූ අතර, මෙම සාකච්ඡාවේදී ඇති වූ ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් 2024 වසරේදී මෙම කාර්යය සිදු නොකෙරුණු බව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණි. 2025 වර්ෂයට අදාළ උපයුක්ත ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඊට අදාළ සැලැස්මක් සහිතව සිදු කරගෙන යාමට | අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව කටයුතු කළ යුතු වන බව. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | සැලසුම් කර ඇති බව දන්වා තිබුණි. | |
| (iii) | 2019 දෙසැම්බර් 17 දිනැති අංක PED/e-GP/Circular/2018 දරන මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ චක්‍රලේඛය සහ 2018 ඔක්තෝම්බර් 23 දිනැති අංක PED/e-GP/Circular/2018 දරන මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ චක්‍රලේඛය | - | චක්‍රලේඛ ප්‍රකාරව විද්‍යුත් ප්‍රසම්පාදනයන් සිදුකිරීමට අදාළ කටයුතු සිදුකර නොතිබුණි. | 2025 වර්ෂයේ දෙවන කාර්තුවේ සිට හැකි සෑම අවස්ථාවකදීම ප්‍රසම්පාදන කටයුතු විද්‍යුත් ප්‍රසම්පාදන ක්‍රමවේදය භාවිතයෙන් සිදු කිරීමට සැළසුම් කර ඇති බව දන්වා තිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව විද්‍යුත් ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු වන බව. |

**3.4. වංචනික ස්වරූපයේ ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගාල්ල සමුද්‍ර කෞතුකාගාරයේ නරඹන්නන් වෙත නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍ර ආදායම බැංකුගත කිරීමේදී සිදුවී ඇති සේවක අක්‍රමිකතාව පිළිබඳ 2022 වර්ෂයේදී සිදුකරන ලද පරීක්ෂණය මත සහ මුදල් රෙගුලාසි 104 (3) ප්‍රාරම්භක වාර්තාව අනුව දෙපාර්තමේන්තුවට අහිමි කර ඇති සමස්ථ ආදායම රු.1,652,605 ක් විය. මේ පිළිබඳව මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව පූර්ණ පරීක්ෂණ වාර්තාවක් පරීක්ෂණයෙන් පසු අලාභය සිදු වූ දිනයේ සිට තුන් මාසයක් ඇතුළතදී ඉදිරිපත් කළ යුතු වුවත්, 2025 මාර්තු 26 විගණිත දින වන විටත් එලෙස කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශ ලේකම්ගේ අංක CA/1/1/24/22 හා 2024.10.23 දිනැති ලිපිය මගින් මු.රෙ. 104(4) ප්‍රකාරව පූර්ණ වාර්තාවක් ලබා ගැනීම සඳහා පත් කර ඇති පරීක්ෂණ මණ්ඩලය මේ වන විට එක් වරක් රැස් වී ඇත. මෙම පරීක්ෂණ මණ්ඩලයේ සාමාජික වශයෙන් අමාත්‍යාංශයේ සංස්කෘතික අංශයේ ප්‍රධාන ගණකාධිකාරී නිලධාරිණිය ද පත් කර ඇත. 2024 වර්ෂයේ ගිණුම් පියවීමේ කටයුතු යෙදී තිබූ හෙයින් පරීක්ෂණ මණ්ඩලයට නැවත රැස් වීමට අවස්ථාවක් ලැබී නොමැත. නුදුරේදීම මණ්ඩලය නැවත රැස් වී මු.රෙ. 104(4) ප්‍රකාරව පූර්ණ වාර්තාව ලබා දීමට කටයුතු කරන බව එහි සාමාජිකයන් විසින් දැනුම් දී ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි 104 (4) ප්‍රකාරව වගකිවයුත්තන් නිශ්චය කර අලාභ හානි අයකරගත යුතුය. |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 දැක්ම හා මෙහෙවර

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් කෞතුක භාණ්ඩ එකතු කළමනාකරණ ප්‍රතිපත්තියක් 2024 දෙසැම්බර් මස දක්වාත් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු සම්පාදනය කර නොතිබුණි. එමෙන්ම ශ්‍රී ලංකාව තුළ ඇති සමස්ථ කෞතුකාගාර පද්ධතියම නියාමනය කිරීමේ අධිකාරී බලය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත ලැබෙන පරිදි පවත්නා නීතියට අදාළ සංශෝධනයන් කර කෞතුකාගාර ක්ෂේත්‍රයේ නියාමන බලය ලැබිය යුතු ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව වෙත එම බලය ලබා ගැනීමට ද ක්‍රියා කර නොතිබුණි. | කෞතුක භාණ්ඩ කළමනාකරණ ප්‍රතිපත්තිය පරිච්ඡේද 03කින් හා අනු මාතෘකා 15කින් සමන්විතය. මෙම කාර්යය දැනටමත් ආරම්භ කොට මෙහි පරිච්ඡේද 02ක් (ප්‍රධාන කොටස) හා අනු මාතෘකා 10 කට අදාළ ප්‍රතිපත්ති කෙටුම්පත් කර අවසන් කර ඇත. 2025 ජූලි 31 වන විට ඉතිරි කොටස සම්පූර්ණ කර බාහිර විද්වතුන්ගේ ද අදහස් ලබා ගැනීම, මහජන මත විමසීම යන කාර්යයන් සිදු කර අමාත්‍යාංශ ලේකම් මඟින් ජාතික ප්‍රතිපත්ති සම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කොට එහි නිර්දේශ සහිතව අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව මෙම කාර්යය අවසන් වේ. ඒ සඳහා 2025 වසර අවසන් වන විට මෙකී කාර්යය සම්පූර්ණ කර මෙම ප්‍රතිපත්ති වලංගු ප්‍රතිපත්තියක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට කටයුතු සම්පාදනය කරන බව දන්වා තිබුණි. | කෞතුක භාණ්ඩ එකතු කළමනාකරණ ප්‍රතිපත්තියක් සැකසීම හා සමස්ථ කෞතුකාගාර පද්ධතිය නියාමනය කිරීමේ අධිකාරී බලය ලැබෙන පරිදි පවත්නා නීතිය සංශෝධනය කළ යුතු වන බව. |
| (ආ) | කෞතුකාගාර සම්බන්ධයෙන් වන ආචාර ධර්ම ICOM (International Council of Museums) ආයතනය විසින් කෞතුකාගාර විෂය ක්ෂේත්‍රය තුළ විශාල පරාසයක් ආවරණය වන පරිදි සකස් කර තිබෙන අතර, එම ආචාර ධර්ම ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන නීති රීති අණපනත් හා ප්‍රතිපත්ති වලට ගැළපෙන අයුරින් කෙටුම්පත් කිරීම 2021 වර්ෂයේ සිට දෙපාර්තමේන්තුව | ICOM සංවිධානය මඟින් ප්‍රකාශයට පත්කර ඇති කෞතුකාගාර සම්බන්ධ ආචාරධර්ම පද්ධතිය ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව මඟින්ද අනුගමනය කරනු ලබයි. එහෙත් ලංකාවේ නීති රීති, අණපනත්, ප්‍රතිපත්ති අනුව වෙනමම සකස් කළ යුතුය. දැනට එම ප්‍රතිපත්ති සකස් | රටට ගැළපෙන පරිදි ICOM මඟින් හඳුන්වාදී ඇති ආචාරධර්ම සකස් කළ යුතු වන බව. |

| | | |
|---|---|---|
| විසින් ආරම්භ කර තිබුණු නමුත්, එම කටයුතු 2025 මැයි 14 දින වන විටත් අවසන් කර නොතිබුණි. | කරමින් පවතින බව දන්වා තිබුණි. | |

## 4.2 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03,04 ඡේදයන්හි විධිවිධාන ප්‍රකාරව ඉදිරි වර්ෂය සඳහා වන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 15 දිනට පෙර සහ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්ථන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර සකස් කොට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය සමඟ එහි පිටපත් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2024 වර්ෂය සඳහා අනුමත ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම 2024 මාර්තු 04 දින විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. 2024 වර්ෂය සඳහා අනුමත කරන ලද ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට අදාළ අනුමැතිය, මූල්‍ය ප්‍රකාශන වලට අනුමැතිය ලබාදුන් දිනය වන 2025 පෙබරවාරි 24 දිනයේම ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් ලබාදී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කිරීමට අදාළ අනුමැතිය අදාළ ගිණුම් වර්ෂය අවසන් වීමෙන් පසු ලබාගෙන තිබුණි. | සංශෝධිත වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාළව, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මඟින් අමාත්‍යාංශ ලේකම් හා අතිරේක ලේකම් (සංස්කෘතික ප්‍රවර්ධන) වෙත 2025 පෙබරවාරි 20 දින ඉදිරිපත් කර තිබූ අතර, 2025 පෙබරවාරි 24 දින අනුමත කර තිබුණු බව දන්වා තිබුණි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 02/2020 අනුව කටයුතු කළ යුතු වන බව සහ ක්‍රියාකාරී සැලැස්මේ සංශෝධනයන් වලට අදාළ අනුමැතිය අදාළ අවස්ථාවේදීම ලබාගත යුතු වන බව. |

## 4.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් රු.මිලියන 02 ක ප්‍රතිපාදන මත කොළඹ ජාතික කෞතුකාගාරයට නාම පුවරුවක් සකස් කිරීමට අදාළ | නාම පුවරුව සකස් කිරීම සඳහා සැලසුම් හා ඇස්තමේන්තු ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා ලද අතර, ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු.5,092,000 ක් විය. ඒ අනුව, මෙම | සැලසුම් සකස් කිරීමේදී ප්‍රතිපාදන අවශ්‍යතාවය පිළිබඳ දැඩි අවධානයකින් කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාර්යය ක්‍රියාත්මක කර නොතිබුණි. | ව්‍යාපෘතිය සඳහා ලැබී තිබූ රු. මිලියන 02 ක මුදල ප්‍රමාණවත් නොවීම හේතුවෙන් ඒ වන විට හදිසි හා අත්‍යවශ්‍ය කාර්යයක් ලෙස ප්‍රතිපාදන අවශ්‍යව පැවති පිටුපස මුර කුටිය අසළ භූගත විදුලි රැහැන යෙදීම සඳහා එම මුදල යොදවන ලදී. 2025 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන ලැබී ඇති බැවින් එම කාර්යය මෙම වර්ෂයේදී නිම කිරීමට නියමිත බව දන්වා තිබුණි. | |
| (ආ) | කොළඹ ජාතික කෞතුකාගාරයේ ජනේලයේ අළුත්වැඩියාව, ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ ආරක්ෂිත භූගත විදුලි රැහැන් යෙදීම, ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ වැහිපීලි අළුත්වැඩියාව සහ ලක්සල ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම යන රු.මිලියන 7.213 ක් වටිනා ව්‍යාපෘති 04 ක් 2024 වර්ෂයේදී සිදු කර තිබුණු නමුත් අනුමත ක්‍රියාකාරී සැලැස්ම තුළ එකී කාර්යයන් අන්තර්ගත කර නොතිබුණි. එසේ වුවද හදිසි අවශ්‍යතාවයන් මත අත්‍යවශ්‍යයෙන්ම සිදු කල යුතු කාර්යයන් වූයේ නම් වර්ෂය තුලදී ක්‍රියාකාරී සැලැස්ම සංශෝධනය කර අදාල පාර්ශවයන්ගෙන් අනුමැතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. | ගොඩනැඟිල්ලේ බාහිර පොළව මට්ටමේ ජනේලය ස්ථාපිත කර ඇති ස්ථානය දක්වා උස සහ එහි අවධානම පිළිබඳව සලකා බලා Scaffolding යොදවා ඒවා සුරක්ෂිතව ස්ථාපිත කිරීමත් සිදු කිරීම, මෙම විදුලි රැහැන හදිසියේ කැඩී යාමෙන් ඇති වූ අනාරක්ෂිත බව හේතුවෙන් එය ඉතා කඩිනමින් ආරක්ෂාකාරී ලෙස සකස් කළ යුතු බැවින් 2024 වර්ෂයේදී මෙම භූගත විදුලි රැහැන යෙදීමේ කාර්යය ගොඩනැඟිලි දෙපාර්තමේන්තුවේ උපදේශනය යටතේ සිදු කිරීම, වැහි පීලි අළුත්වැඩියා කිරීමේ කාර්යය 2024.06.24 දින නිම කරන ලද අතර, වැසි ජලය නිසි ලෙස බැහැර යාමට සැලැස්වීම මඟින් වහළය දිරා යාම හා බිත්ති දියසෙවෙල් බැඳී දුර්වර්ණ වීම වළක්වා ගත හැකි වීම සහ රු.මි. 48 ක ඇස්තමේන්තුවට අදාළ ප්‍රතිපාදන 2024 වර්ෂයේදී නොතිබූ බැවින් සහ 2024 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි කාර්යයන් කිහිපයක් අවලංගු කර රු.මි.02 ක මුදලක් ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව වෙත පවරා ලක්සල ගොඩනැඟිල්ලෙහි ජලය කාන්දු වන ස්ථාන සකස් කිරීමේ කාර්යය සිදු කරන ලදී. රු.මි. 07 ක ඇස්තමේන්තුව සඳහා ප්‍රතිපාදන නොමැති බැවින් රු.මි. 02 පවරා අත්‍යවශ්‍ය කාර්යයන් සිදු කරන ලද බව දන්වා තිබුණි. | හදිසි අවශ්‍යතාවයන් ඇතිවූ විට වර්ෂාවසානයට පෙර සැලසුම් සංශෝධනය කර ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අනුමැතිය ලබාගත යුතු වන බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | කෞතුකාගාර පරිශ්‍රය වටා ඇති පෞරාණික ස්මාරක තාප්පය හා දැල් වැට අලුත්වැඩියාව, කොළඹ කෞතුකාගාරයේ වහල අළුත්වැඩියාව සහ අනුරාධපුර ජන කෞතුකාගාරයේ ප්‍රදර්ශන මැදිරි නවීකරණය යන ව්‍යාපෘති 03 හි ඇස්තමේන්තු පිරිවැය රු.මිලියන 33 ක් වූ අතර, 2024 වර්ෂයේදී එම ව්‍යාපෘති වල වැඩ අවසන් කර නොතිබුණි. | කෞතුකාගාර පරිශ්‍රය වටා ඇති පෞරාණික ස්මාරක තාප්පය හා දැල් වැට අළුත්වැඩියා කිරීමේ කාර්යය 2025 මාර්තු මස සම්පූර්ණයෙන් අවසන් කරන ලද අතර, ශ්‍රවනාගාර ගොඩනැගිල්ලේ වහළය පිහිටා ඇති කොන්ක්‍රීට් තට්ටුවේ ජලය කාන්දු වීම වැළැක්වීමට අවශ්‍ය කරන කටයුතු නාවික හමුදාව විසින් මේ දිනවල ඉටු කරමින් පවතී. තව ද, කෞතුකාගාර පොලිස් මුරපොළ පිහිටා ඇති ගොඩනැගිල්ලේ වහළයෙහි ඇති කොන්ක්‍රීට් තට්ටුවෙන් ද ජලය කාන්දු වීම වැළැක්වීම සඳහා වන අළුත්වැඩියා කටයුතු 2025 ජූනි මස ආරම්භ කිරීමට නියමිත අතර, එම කාර්යය 2025.12.31 දින වන විට අවසන් කිරීමට අපේක්ෂිත බව සහ අනුරාධපුර ජන කෞතුකාගාරයේ අභ්‍යන්තර ප්‍රදර්ශන නවීකරණ කටයුතු ආරම්භ කිරීම නිසි කාලවකවානුව තුළ සිදුකිරීමට නොහැකි වූ බව දන්වා තිබුණි. | ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කළ යුතු වන බව. |

### 4.4 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කෞතුක භාණ්ඩ භාරකාරීත්වය හා ආරක්ෂා කිරීම සම්බන්ධ ගැටලු, ඒවාට අදාළ ලිපිගොනු විධිමත්ව පවත්වා නොගැනීම, නිලධාරීන් වෙනස්වීමේදී භාණ්ඩ භාරකාරීත්වය නිසි පරිදි නොපැවරීම යනාදී දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ දුර්වලතා නිසා වර්ෂ 1877 සිට 1957 දක්වා කාලයට අදාළ කෞතුක භාණ්ඩ වර්ග 07 කට අයත් භාණ්ඩ අස්ථානගත වී තිබුණු අතර, මෙම අලාභය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 105 (2)(ඇ) විධි විධාන පරිදි | මේ පිළිබඳව මණ්ඩලයක් පත්කොට පූර්ණ වාර්තාවක් සකස් කර මුදල් රෙගුලාසි 105 (2) (ඇ) විධිවිධාන අනුව කටයුතු කිරීම සඳහා 2024.04.24 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. අමාත්‍යාංශය මගින් 2024.05.28 දින මේ සම්බන්ධ වැඩිදුර වාර්තාවක් ඉල්ලුම් කරන ලදුව 2024.06.25 දින අදාළ වැඩිදුර තොරතුරු ඉදිරිපත් කර ඇති බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි 105 (2) (ඇ) විධිවිධාන අනුව කටයුතු කළ යුතු වන බව. |

| | | | |
|---|---|---|---|
| | කටයුතු කර භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ නියමයන් ලබා ගැනීමට වාර්තාවේ දින වන විටත් කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | ස්වභාවික විද්‍යා කෞතුකාගාරයේ ජෛව විද්‍යා මැදිරියට යාබදව පවතින දෙවන මහලේ වම් පස කොටස මුළුමනින්ම වසා දමා 2012 වසරේ සිට මේ දක්වා මහජන ප්‍රදර්ශනයෙන් ඉවත් කර තිබුණු අතර, අවශ්‍ය අළුත්වැඩියාවන් සිදු කර මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීමට හෝ ඵලදායී වෙනත් කාර්යයකට මෙම කොටස භාවිතා කිරීමට 2024 දෙසැම්බර් 31 දින දක්වා කටයුතු කර නොතිබුණි. | ප්‍රදර්ශන කුටි 10ක් සඳහා ප්‍රදර්ශනය කිරීමට නියමිත ආදර්ශක තෝරා වෙන් කර ඇති අතර, දැනටමත් නිම කර ඇති කුටි 10 තුළ වූ පසුබිම් තීන්ත ගා පිළිසකර කිරීමේ කටයුතු ආරම්භ කර ඇත. තවද, මැදිරිය පිළිබඳ ප්‍රධාන ප්‍රදර්ශන පුවරුව හා තොරතුරු ඇතුළත් ප්‍රදර්ශන පුවරු 06 සකස් කර ඇති අතර, මැදිරියෙහි සිවිලිම සකස් කිරීම, පොලොව සකස් කිරීම හා වායුසමීකරණය කිරීම සඳහා කාර්යය පැවරීමේ ලිපි ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙත යොමු කර ඇති බව දන්වා තිබුණි. | අවශ්‍ය අළුත්වැඩියාවන් සිදු කර මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත කිරීමට කටයුතු කළ යුතු වන බව. |

## 4.5 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කොළඹ ජාතික කෞතුකාගාරයේ 2012 මාර්තු 16 දින සිදු වූ ඇස්තමේන්තුගත වටිනාකම රු.4,440,140 ක් වූ කෞතුක භාණ්ඩ 221 ක් සොරකම් කිරීම සිදුවී 2024 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 12 ක කාලයක් ගත වී පැවති නමුත්, අදාල චූදිතයන්ට නීතිපති දෙපාර්තමේන්තුව විසින් චෝදනා ගොනුකොට නොමැති වීම හේතුවෙන් මේ දක්වාත් නඩු කටයුතු අවසන් කිරීමට නොහැකි වී තිබුණි. | කොළඹ ජාතික කෞතුකාගාරයේ 2012.03.16 දින සොරකම් කරන ලද භාණ්ඩ වෙනුවෙන් මු.රෙ. 104(3) අනුව කටයුතු කිරීමට අමාත්‍යාංශ ලේකම්වරයා විසින් කමිටුවක් පත් කරන ලදී. දැනට අස්ථානගත වී නැවත හමු වූ මෙම භාණ්ඩ මුද්‍රා තබා උසාවි නියෝග මත දෙපාර්තමේන්තුව භාරයේ ඇත. නඩු කටයුතු අවසන් වන තෙක් මෙම භාණ්ඩවල මුද්‍රා ඉවත් කළ නොහැකි බැවින් එම කටයුතු අවසන් වන තුරු මු.රෙ. 104(3) අනුව කටයුතු කිරීමට හැකියාවක් නැති බව දන්වා තිබුණි. | අදාල පාර්ශව සමඟ සම්බන්ධීකරණය පවත්වා ගනිමින් පසු විපරම් කටයුතු නිරන්තරයෙන් සිදු කිරීම මගින් නඩු කටයුතු කඩිනම් කර ගැනීමට කටයුතු කල යුතු බව. |

**4.6 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව විසින් ප්‍රවේශ පත්‍ර මුද්‍රණයේදී, සෙසු කෞතුකාගාර 2022 සිට 2024 දක්වා වර්ෂ 03 ක කාලය තුළ සිදුකරනු ලැබූ සාමාන්‍ය වාර්ෂික ප්‍රවේශ පත්‍ර ඉල්ලීම් පිළිබඳව නොසලකා, එක් වරකදී ප්‍රවේශ පත්‍ර පොත් 500 සිට 2000 අතර තොග වශයෙන් ටිකට් පොත් මුද්‍රණය කර තිබුණි. දෙපාර්තමේන්තු වැය ලෙජය අනුව 2022 වර්ෂය තුළ ප්‍රවේශ පත්‍ර 100 ක් මුද්‍රණය වෙනුවෙන් රු.1,698,148 ක්ද, 2023 වර්ෂයේ ප්‍රවේශ පත්‍ර 3500 ක් මුද්‍රණය වෙනුවෙන් රු.2,576,061 ක් ලෙසට රු.4,274,259 ක ප්‍රතිපාදන වැයකර තිබුණි. මෙලෙස සාමාන්‍ය ප්‍රවේශ පත්‍ර පිළිබඳ වාර්ෂික ඉල්ලීම නොසලකා වැඩිපුර ප්‍රවේශ පත්‍ර මුද්‍රණය කිරීමට මුදල් වැය කිරීම අනාර්ථික වියදමක් බව නිරීක්ෂණය විය. | කොවිඩ් වසංගත තත්ත්වයෙන් පසු ඇති වූ සංචාරක කර්මාන්තයේ පිබිදීමත් සමඟ නරඹන්නන් සංඛ්‍යාව වඩා වැඩි වෙතැයි අපේක්ෂාවෙන් නැවත ප්‍රවේශපත්‍ර මුද්‍රණය සිදු කර ඇත. පසුගිය වසර වලට සාපේක්ෂව 2024 සහ 2025 වසරවල නරඹන්නන්ගේ සැලකිය යුතු ප්‍රගතියක් මේ වන විටත් අත්කරගෙන ඇති බැවින්, නැවත ප්‍රවේශපත්‍ර මුද්‍රණය නොකොට මෙම ප්‍රවේශපත්‍ර තොගයම භාවිතය සඳහා යොදා ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | නවීන තාක්ෂණික ක්‍රමවේදයකට අනුව ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ පද්ධතියක් සකස් කළ යුතු වන බව. |

**4.7 කළමනාකරණ දුර්වලතා**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ජාතික කෞතුකාගාර පුස්තකාලය තුළ වසර 150 කට වඩා පැරණි පොත් පත් එකතුවක් පවතින අතර, කාලාන්තරයක් මුළුල්ලෙහි සංරක්ෂණය කළ නොහැකි හා පරිහරණය කළ නොහැකි තත්ත්වයට පත්ව ඇති පොත් පත් රාශියක් තිබුණි. මෙලෙස විනාශ වී ඇති පොත් පත් පිළිබඳ පුස්තකාල අපහරණ ලේඛනයක්ද පුස්තකාල අංශය තුළ නොතිබුණු අතර අපහරණය කළ යුතු පොත්පත් පිළිබඳ අපහරණ මණ්ඩලයක් සහ ඊට අදාළ ප්‍රමිතීන්ද සකස් කර නොතිබුණි. | දැනට පුස්තකාලයේ ඇති සංරක්ෂණය කර යථා තත්ත්වයට පත් කළ නොහැකි පොත්පත් සියල්ල ලේඛනගත කර, ඒවා හඳුනා ගැනීම සිදු කිරීම පුස්තකාල කාර්යය මණ්ඩලය මඟින් ආරම්භ කර තිබේ. අදාළ වාර්තාව අවසන් වූ පසු සුදුසු අපහරණ මණ්ඩලයක් පත්කොට එසේ යථා තත්ත්වයට පත් කළ නොහැකි පොත්පත් විධිමත් ක්‍රමවේදයන්ට අනුව අපහරණය කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | අපහරණය කළ යුතු පොත්පත් පිළිබඳ අපහරණ මණ්ඩලයක් පත්කර ඊට අදාළ ප්‍රමිතීන්ද සකස් කළ යුතු වන බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ගිනි ආරක්ෂණ පද්ධතියට සමගාමීව පුස්තකාලය තුළ වායු සමීකරණ පද්ධතියක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, විදුලි පංකා කිහිපයක් පමණක් සවිකර පැවතුණි. වසර ගණනාවක් පැරණි පෞරාණික වටිනාකමකින් යුත් පොත් හා පුස්කොළ පොත් සුරක්ෂිතව තවත් අනාදිමත් කාලයක් දෙස් විදෙස් පාඨකයින්ට පරිහරණය කිරීම සඳහා අවස්ථා සලසා දීම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වුවත්, මෙම ග්‍රන්ථ වල පැවැත්මට ප්‍රශස්ථ මට්ටමට පැවතිය යුතු විදුලි ආලෝකය වායු සමීකරණ තත්ත්වයන් මෙන්ම ආර්ද්‍රතාව පාලනයට අවශ්‍ය තාක්ෂණික උපකරණ භාවිතා නොකිරීම නිසා වටිනා ග්‍රන්ථ විනාශ වීමේ අවධානමක් පැවතුණි. එසේම පුස්තකාල පරිසරයක් තුළ පැවතිය යුතු සුවපහසු සේවා පරිසරයක් නොමැති වීම හා දැඩි දූවිලි සහිත තත්ත්වයක් පැවතීම හේතුවෙන් සේවයේ නියුතු කාර්ය මණ්ඩලය ශ්වසන රෝග හා චර්ම රෝග වලට ගොදුරු වීමට දැඩි ප්‍රවණතාවයක් පැවතුණි. | දූවිලි තත්ත්වය වැඩි වශයෙන් ඇති වන්නේ ඉහළ මාලයේ ප්‍රදර්ශන සඳහා නරඹන්නන් ඇවිදීම නිසා එම මහලේ දැව තට්ටුව අතුරින් පුස්තකාලය තුළට දූවිලි පතිත වීම හේතුවෙනි. එම නිසා පුස්තකාලයේ වායු සමීකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පවතී. එබැවින් ඉදිරියේදී ඒ පිළිබඳව පිළිගත් ආයතනයකින් සැලසුම් හා ඇස්තමේන්තු ලබා ගෙන ප්‍රතිපාදන වෙන් කරගෙන අවම වශයෙන් පුස්තකාලයේ කියවීම් ශාලාව ඇතුළු පුස්කොළ පොත් එකතුව හා දුර්ලභ පොත් එකතුව පවතින අංශ සඳහා වායු සමීකරණ යන්ත්‍ර සවි කිරීමට අපේක්ෂිත බව දන්වා තිබුණි. | ග්‍රන්ථ විනාශ වීමේ අවධානම වැළැක්වීම සඳහා සහ දෙස් විදෙස් පාඨකයන්ට සුවපහසු සේවා පරිසරයක් සකස් කළ යුතු වන බව. |
| (ඇ) | දෙපාර්තමේන්තුවේ භූ විද්‍යා අංශයේ මැණික් ගල් 272 ක් ලංකා බැංකුවේ මෙට්‍රොපොලිටන් ශාඛාවේ 1964 සැප්තැම්බර් 18 දින සිට තැන්පත් කර පැවති අතර, 1993 වර්ෂයේ සිදු කළ භෞතික පරීක්ෂාවේදී එයින් එක් මැණික් ගලක් කෘතිම ගලක් ලෙසට අනාවරණය වීමෙන් පසුව එම ගල භූ විද්‍යා අංශයේ තැන්පත් කර පැවතුණි. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ රත්න විද්‍යාඥයෙකුගේ සහාය ලබාගෙන මෙම ඉතිරි මැණික් ගල් 271 හි වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධව අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය ලබා ගෙන ඉදිරි කටයුතු ඉටු කිරීමට අපේක්ෂා කරන බව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාවට පිළිතුරු වශයෙන් ඉදිරිපත් කර | මෙම මැණික් ගල් එකතුව පරීක්ෂා කිරීමට ඒවා මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත ගෙන යාමට අවශ්‍ය බව ඔවුන් ලිඛිතව දන්වා ඇත. එහෙත් 2024 දෙවන කාර්තුවේ පැවති දෙපාර්තමේන්තු විගණන කළමනාකරණ කමිටු රැස්වීමේදී මෙම මැණික් එකතුව බැහැරට ගෙන යාම අවධානම් සහගත බව තීරණය කරන ලද බැවින් එම කාර්යය මෙතෙක් පමා වී ඇත. එහෙත් මෙම මැණික් එකතුව බර මිනුම් ගෙන ඡායාරූප ලබාගෙන නිසි පරිදි වාර්තා කිරීම සඳහා කමිටුවක් නම් කර අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත. එම අනුමැතිය ලද පසු බැංකු පරිශ්‍රය තුළදීම මෙම මැණික් ගල් එකතුව නිසි පරිදි ඡායාරූපගත කර බර මිනුම් ලබා ගැනීමට කටයුතු කරනු ඇති බව දන්වා තිබුණි. | වර්තමාන මූල්‍ය වටිනාකම තක්සේරු කිරීමට කටයුතු කළ යුතු වන බව. |

| | | | |
|---|---|---|---|
| | ඇති නමුත්, 2025 මාර්තු මස දක්වා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | | |
| (ඈ) | 2024 දෙසැම්බර් 31 දිනට කොළඹ, මහනුවර හා පොළොන්නරුව කෞතුකාගාර වල හැර සෙසු කෞතුකාගාර 08 හි CCTV කැමරා පද්ධතීන් සවි කර නොතිබීම හේතුවෙන් කෞතුක භාණ්ඩ අනාරක්ෂිතව පැවතුණි. | CCTV කැමරා පද්ධති සවි කරනු ලබනුයේ ඒ ඒ කෞතුකාගාරවල මුහුණ පෑමට සිදු වන තර්ජනවල අනුපිළිවෙල අනුවය. සියළුම කෞතුකාගාරවල CCTV කැමරා පද්ධති සවි කිරීමට ප්‍රතිපාදන සපයා ගැනීම අසීරු කරුණකි. එබැවින් වර්ෂයෙන් වර්ෂයට ඒ ඒ කෞතුකාගාරවල තිබෙන තර්ජන, කෞතකු භාණ්ඩ එකතුව සැලකිල්ලට ගෙන ඉදිරියේ දී අනෙකුත් කෞතුකාගාරවලට ද CCTV කැමරා පද්ධති සවි කිරීමට අපේක්ෂා කරන බව දන්වා තිබුණි. | කෞතුක භාණ්ඩවල ආරක්ෂාව තහවුරු කිරීම දෙපාර්තමේන්තුවේ වගකීමක් බව. |
| (ඉ) | 2024 වර්ෂය සඳහා පැවැත්වූ කෞතුක භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර, මෙම භාණ්ඩ සමීක්ෂණයේදී, ප්‍රායෝගිකව පැන නගින අපහසුතාවයන් මඟහරවා ගැනීම සඳහා කෞතුක භාණ්ඩ දත්ත පද්ධතියක් ස්ථාපිත කොට තීරුකේත සහිත පද්ධතියකට (Barcode System) එක්කර ගැනීමෙන් වාර්ෂික සංගණන කාර්යය පහසු කර ගැනීමට දෙපාර්තමේන්තුව ක්‍රියාකර නොතිබුණි. | දැනට කෞතුක භාණ්ඩ සම්බන්ධ තොරතුරු ඇතුළත් කිරීම සඳහා දත්ත පද්ධතියක් සකස් කරමින් පවතී. එම පද්ධතිය සකස් කර අවසන් වූ පසු සියළුම අංශ හා කෞතුකාගාරවල කෞතුක භාණ්ඩ එම දත්ත පද්ධතියට ඇතුළත් කිරීමට නියමිතය. කෞතුක භාණඩවල පෘෂ්ට මත Barcode ඇලවීම එම කෞතුක භාණ්ඩවලට හානිදායක බැවින් එය කෞතුක භාණ්ඩ සම්බන්ධයෙන් සිදු කළ නොහැකිය. එබැවින් විධිමත් දත්ත පද්ධතියක් සකස් කිරීම තුළින් ඒවා විවිධ අවශ්‍යතා සඳහා පහසුවෙන් හැසිරවීම සිදු කළ හැකි බව දන්වා තිබුණි. | කෞතුක භාණ්ඩ සමීක්ෂණයේදී පැන නගින ප්‍රායෝගික ගැටලු මඟ හරවා ගැනීමට කටයුතු කළ යුතු වන බව. |
| (ඊ) | 2017 නොවැම්බර් 09 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව අනුව පොළොන්නරුව පුරාණ තාක්ෂණ කෞතුකාගාරයට අවශ්‍ය තොරතුරු, තාක්ෂණික හා සන්නිවේදන පහසුකම් සලසා ගැනීමේදී ලංසු කැඳවීමකින් තොරව ශ්‍රී ලංකා ටෙලිකොම් හා ශ්‍රී ලංකා මොබිටෙල් යන ආයතනවල සහාය ලබා ගැනීමටද අනුමැතිය ලබාදී තිබුණි. ඒ අනුව රු.3,510,188 ක (බදු සහිත) මුදලකට ශ්‍රී ලංකා මොබිටෙල් ආයතනය මඟින් M Gate ක්‍රමවේදය | පොළොන්නරුව පුරාණ තාක්ෂණික කෞතුකාගාරයේ ටිකට්පත් නිකුත් කිරීමේ ක්‍රමවේදයේ යම් යම් තාක්ෂණික හා විවිධ කාරණා මත ගැටලුකාරී තත්ත්වයන් පවතී. මෙම ටිකට් පොත් මුද්‍රණයේදී එහි සීරියල් අංකයක් හෝ අනුක්‍රමික අංකයක් මුද්‍රණය නොවීම, ටිකට්පත් මුද්‍රණය කිරීමට පෙර ඒවා පෙට්ටියක බහාලන ලද බණ්ඩලයක් වශයෙන් පවතින අතර, ඒවායෙහි ටිකට්පත් | වසර 06 ක කාලයක් සිට පවතින මෙම තාක්ෂණික ගැටලු නිරාකරණය කළ යුතු වන බව. |

| | |
|---|---|
| භාවිතයෙන් ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමේ ක්‍රමවේදය සිදුකර තිබුණු අතර, මෙම ක්‍රමවේදය 2019 අප්‍රේල් 05 දින සිට දෙපාර්ශවය අතර ගිවිසුම්ගතවීමත් සමඟ ආරම්භ වී තිබුණි. මෙම ක්‍රමවේදය තුළ ටිකට්පත් මුද්‍රණයේදී යම් තාක්ෂණික ගැටලු පවතින අතර, එහි සීරියල් අංකයක් හෝ අනුක්‍රමික අංකයක් මුද්‍රණය නොවීම, ටිකට්පත් මුද්‍රණය කිරීමට පෙර ඒවා පෙට්ටියක බහාලන ලද බණ්ඩලයක් වශයෙන් පවතින අතර, ඒවායෙහි ටිකට්පත් 1,000 ක් තිබෙන බවට මොබිටෙල් ආයතනය සඳහන් කළද, ටිකට්පත් ගණනය කර බැලීමේදී විවිධ බණ්ඩල් වල ටිකට්පත් විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්තව පැවතීම, මෙම පද්ධතියේ හටගන්නා වූ තාක්ෂණික දෝෂයන් මොබිටෙල් ආයතනයෙන්ම මාර්ගගත ක්‍රමය මඟින් නිරාකරණය කළ යුතු වීම හා ඒ සඳහා විශාල කාලයක් වැයවීම නිසා ඒ අතරතුර ටිකට්පත් නිකුත් කිරීමේ කටයුතු සිදුකළ නොහැකි වීම වැනි ගැටලු පවතින අතර, ටිකට්පත් බණ්ඩලයෙහි පවතින සමහර ටිකට්පත් මුද්‍රණ යන්ත්‍රයෙන් මුද්‍රණය නොවීම හා එවිට ඒවා ඉවත් කිරීමට සිදුවීම වැනි කරුණුද පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. තවද, 2019 වර්ෂයේ සිට මේ දක්වා වසර 06 ක කාලයක් ගතවී තිබුණද මෙම තාක්ෂණික ගැටලු නිරාකරණය කර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි. | 1,000 ක් තිබෙන බවට මොබිටෙල් ආයතනය සඳහන් කළද, ටිකට්පත් ගණනය කර බැලීමේදී විවිධ බණ්ඩල් වල ටිකට්පත් විවිධ ප්‍රමාණයන්ගෙන් යුක්තව පැවතීම, මෙම පද්ධතියේ හටගන්නා වූ තාක්ෂණික දෝෂයන් මොබිටෙල් ආයතනයෙන්ම මාර්ගගත ක්‍රමය මඟින් නිරාකරණය කළ යුතු වීම හා ඒ සඳහා විශාල කාලයක් වැයවීම නිසා ඒ අතරතුර ටිකට්පත් නිකුත් කිරීමේ කටයුතු සිදුකළ නොහැකි වීම, ටිකට්පත් බණ්ඩලයෙහි පවතින සමහර ටිකට්පත් මුද්‍රණ යන්ත්‍රයෙන් මුද්‍රණය නොවීම හා එවිට ඒවා ඉවත් කිරීමට සිදුවීම වැනි ප්‍රායෝගික ගැටලු පවතී. මේ හේතුවෙන් මෙම ක්‍රමවේදය අනෙකුත් කෞතුකාගාරයන් සඳහා හඳුන්වා නොදී නව වෙබ් අඩවිය හරහා ජාලගත කරන ලද ටිකට්පත් ක්‍රමවේදයක් හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දන්වා තිබුණි. |

## 5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2024 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 566 ක් වුවද, තත්‍ය කාර්ය මණ්ඩලය 393 ක් වීමෙන් පුරප්පාඩු සංඛ්‍යාව 173 ක් විය. මෙම පුරප්පාඩු සංඛ්‍යාව විධායක මට්ටමේ තනතුරු 16 න් තනතුරු 07 ක් සහ තෘතියික මට්ටමේ තනතුරු 05 න් 03 ක්ද, ද්විතියික මට්ටමේ තනතුරු 121 කින්ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 42 කින්ද සමන්විත වූ අතර, වසර 15 ක | 2024.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 566ක් අතරින් තථ්‍ය කාර්යය මණ්ඩලය 393ක් වූ අතර, මුළු පුරප්පාඩු සංඛ්‍යාව 173ක් විය. මුළු පුරප්පාඩු සංඛ්‍යාව 173ක් වුවත්, තථ්‍ය කාර්යය මණ්ඩලය යටතේ දෙපාර්තමේන්තුවේ ව්‍යවස්ථාපිත වගකීම් උපරිම කාර්යසාධනයෙන් යුක්තව පවත්වාගෙන යනු ලැබේ. විධායක මට්ටමේ, තෘතීයික | අත්‍යාවශ්‍ය සේවක ඌනතා සම්පූර්ණ කර ආයතනයේ කාර්යසාධනය ඉහළ නැංවීමට ක්‍රියා කළ යුතු වන බව. |

පමණ සිට ජාතික කෞතුකාගාරයේ අධි ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුර පුරප්පාඩු වී පැවතුණි.

මට්ටමේ, ද්විතීයික මට්ටමේ හා ප්‍රාථමික තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා දිගින් දිගටම රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙත හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් කර ඇත. අධි ශ්‍රේණියේ පුස්තකාලයාධිපති තනතුරේ පුරප්පාඩු පැවතිය ද, III ශ්‍රේණියේ පුස්තකාලයාධිපතිනියන් දෙදෙනෙකුගේ අධීක්ෂණය යටතේ පුස්තකාල කටයුතු ප්‍රශස්තව පවත්වාගෙන යනු ලබන බව දන්වා තිබුණි.